# දහම් පාසල් අවසාන විභාගය

## බුද්ධ චරිතය

## පසුගිය වර්ෂයන්හී ප්‍රශ්න

## [01] බුද්ධ කාලීන භාරතීය සමාජ පසුබිම.

### [[[ 2024/2025 ]]]

### 01 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණයකු දැනුම ලබාගත යුතු යැයි පිළිගැනෙන චතුර් වේදය ලියා දක්වන්න.
II බ්‍රාහ්මණ සංවිධානය තුළ පඤ්චම කුලයට අයත් යැයි සැලකෙන කුල හතරක් නම් කරන්න.
III බ්‍රාහ්මණ සමාජය තුළ ශුද්‍රයන්ට අහිමි වූ මූලික අයිතිවාසිකම් වලට ක්ෂේත්‍ර තුනක් කෙටියෙන් හඳුන්වන්න.
IV බුද්ධ කාලීන භාරතීය ආගමික පසුබිම හා සමාජ පසුබිම කෙටියෙන් පැහැදිළි කරන්න.

### [[[ 2020/2021/2022/2023 ]]]

### 01 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ ධර්මයට අනුව චතුර් ආශ්‍රම ධර්ම නම් කරන්න.
II ඒ ඒ ආශ්‍රම ධර්මයෙන් අර්ථවත් කෙරෙන ජීවිතයේ වැදගත් අවස්ථා ලියා දක්වන්න.
III බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීම තුළ භාරතීය කාන්තාවට හිමිවූ තත්වය කෙටියෙන් පහදන්න.
IV බුදුසමය තුළ භාරතීය කාන්තාව ලැබූ ආගමික හා සමාජීය නිදහස උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

### [[[ 2019/2020 ]]]

### 01 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණයන්ගේ අනුශාසකත්වය හා සංවිධානව පැවැත්වූ යාග හෝම වර්ග හතරක් නම් කරන්න.
II යාගහෝම පැවත්වීම සඳහා යොදාගත් දෑ අතරින් හතරක් දක්වන්න.
III බ්‍රාහ්මණ සමාජය තුළ වෛශ්‍යාන්ට හිමිවූ කාර්යභාරය කෙටියෙන් පහදන්න.
IV බුද්ධ කාලීන භාරතයේ සමාජ විෂමතාවලට චතුර් වර්ණය හෙවත් කුල භේදය පදනම් වූ අයුරු කෙටියෙන් විස්තර කරන්න.

## [[[ 2018/2019 ]]]

## 01 වන ප්‍රශ්නය

I මහා බ්‍රහ්මයා විසින් චතුර් වර්ණය මවන ලද ස්වකීය ශරීරයේ ස්ථාන හතර ලියා දක්වන්න.

II බ්‍රාහ්මණ ධර්මයට අනුව පුද්ගල ජීවිතයේ චතුර් ආශ්‍රම ධර්ම නම් කරන්න.

III ක්ෂත්‍රිය වර්ණයට හිමි ස්වධර්ම කෙටියෙන් විස්තර කරන්න.

IV "චතුර් ආශ්‍රම ධර්ම බ්‍රාහ්මණ ආගමේ අධිකාරයකට වඩා සැළසුම් සහගත ජීවිතයක අවශ්‍යතාව කියා දෙන ඉගැන්වීමකි". විචාරයකට ලක් කරන්න.

## 02 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ සමාජය තුළ කාන්තාවට නිසි තැන හිමි නොවුණු බව සනාථ කිරීමට කරුණු හතරක් පෙන්වා දෙන්න.

II බුදු සමය තුළ කාන්තාවට නිසි තැන ලබා දුන් බවට සාධක හතරක් ඉදිරිපත් කරන්න.

III භික්ෂුණී සමාජය තුළ කාන්තාව ලැබූ සැනසීම තෙරණී චරිත දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

IV නූතන සමාජයෙහි කාන්තා හිංසනය පිටු දැකීමෙහිලා ගත හැකි ක්‍රියා මාර්ග බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් පැහැදිළි කරන්න.

## [[[ 2017/2018 ]]]

## 01 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව චතුර් වර්ණයට අයත් කුල හතර නම් කරන්න.

II බ්‍රාහ්මණ වර්ණයට හිමි ස්වධර්ම ලියා දක්වන්න.

III සමාජ ප්‍රභවය පිළිබඳ බ්‍රහ්මණ මතය කෙටියෙන් විස්තර කරන්න.

IV වර්ණ ශුද්ධිය හෙවත් ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ බ්‍රාහ්මණ මතය අස්සලායන සූත්‍රය ඇසුරින් ඉදිරිපත් කොට, වර්ණ ධර්ම හා ස්වධර්මවලට අදාළ බුදු සමයේ විචාරය පෙන්වා දෙන්න.

## [[[ 2016/2017 ]]]

## 01 වන ප්‍රශ්නය

I 'වේදගූ' නමින් හැඳින්වෙන බ්‍රාහ්මණයා වේදයෙන් විශාරද බව ලබන චතුර් වේදය නම් කරන්න.

II වේදය ගුරු කොටගෙන සැකසුණු භාරතීය සමාජ ක්‍රමයෙහි ප්‍රධාන කුල හතර හැරුණු විට 'පංචමක' නමින් හැඳින්වෙන ඉතා පහත් කුළ පහක් ගැන සඳහන් වේ. එයින් හතරක් ලියා දක්වන්න.

III බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව සමාජයෙහි සිව්වෙනි ස්ථානයෙහිලා සැළකෙන ශුද්‍ර වර්ණයට හිමි ස්වධර්ම පෙන්වා දෙන්න.

IV බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව සැකසුණු බුද්ධ කාලීන භාරත සමාජ විෂමතා කෙරෙහි බලපෑ වර්ණ ධර්ම බුදුන්ගේ විචාරයට ලක් වූ ආකාරය විමසන්න.

## [[[ 2015/2016 ]]]
## 01 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව මහා බ්‍රහ්ම සතු ශක්තිය ප්‍රකාශ කෙරෙන යෙදුම් ( පර්‍යාය වචන) හතරක් නම් කරන්න.

II වෛශ්‍ය වර්ණයට හිමි ස්වධර්ම නම් කරන්න.

III බ්‍රාහ්මණ ධර්මවලට අනුව පුද්ගලයෙකුගේ ජීවිතය චතුර් ආශ්‍රම ධර්ම තුළ පවත්වාගත යුතු ආකාරය කෙටියෙන් පැහැදිළි කරන්න.

IV බ්‍රාහ්මණ ඉගැන්වීම් බුදුරදුන්ගේ විචාරයට ලක් වූ අයුරු පෙන්වා දෙන්න.

## [[[ 2014/2015 ]]]
## 01 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතීය සමාජයේ බ්‍රාහ්මණ මතයට අනුව ක්‍රියාත්මක වූ ප්‍රධාන කුල හතර නම් කරන්න.

II ක්ෂත්‍රිය වර්ණයට හිමි “ස්වධර්ම” නම් කරන්න.

III බුද්ධ කාලීන භාරතීය සමාජයේ බ්‍රාහ්මණ මතයට අනුව කාන්තාවට හිමිවූ තත්ත්වය කෙටියෙන් පැහැදිළි කරන්න.

IV බුදු සමය තුළ කාන්තාවගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද තහවුරු වූ අයුරු පෙන්වා දෙන්න.

## [[[ 2013/2014 ]]]
## 01 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව සමාජ ප්‍රභවය කෙටියෙන් දක්වන්න.

II බ්‍රාහ්මණ වර්ණයට අයත් ස්වධර්ම නම් කරන්න.

III බ්‍රාහ්මණ ඉගැන්වීම් අතර වර්ණ ධර්ම හා ස්වධර්ම සමාජ විෂමතාවන්ට හේතු වූ අයුරු පෙන්වා දෙන්න.

IV වර්ණ ධර්ම හා ස්වධර්ම පිළිබඳව බුදුරදුන්ගේ විචාරය පැහැදිළි කරන්න.

## [[[ 2012/2013 ]]]
## 02 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ සමාජයේ චතුර් වර්ණයත්, බුදුසසුනේ සිව්වනක් පිරිසත් නම් කරන්න.

II බ්‍රාහ්මණ ඉගැන්වීම් වලට අනුව චතුර් වර්ණය බිහි වූයේ මහා බ්‍රහ්මයාගේ කවර අවයව වලින් දැයි දක්වන්න.

III “බුද්ධ කාලීන භාරතයේ සමාජ විෂමතාවට බ්‍රාහ්මණ ඉගැන්වීම් ඉවහල් විය” යන ප්‍රකාශය තහවුරු කරන්න.

IV බ්‍රාහ්මණ ඉගැන්වීම් වලින් පීඩාවටපත් භාර්තීය සමාජයට සහනය උදාකර දීම සඳහා බුදුන් වහන්සේ දැරූ වෙහෙස ඇගයීමට ලක් කරන්න.

## [[[ 2011/2012 ]]]

## 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීනව භාරතයේ පැවති කුල හතර නම් කරන්න.

II ඔබ විසින් ලියන ලද කුල හතරෙන් එකකට පැවරී තිබූ කාර්‍ය හතරක් ලියන්න.

III බ්‍රාහ්මණ ඉගැන්වීම් හේතුවෙන් භාරතීය සමාජයෙහි උද්ගතව තිබුණු පීඩාකාරී තත්ත්වයෙන් ජනයා මුදවා ගැනීම සඳහා බුදුන් වහන්සේ අනුගමනය කළ ක්‍රියා මාර්ග තුනක් පැහැදිළි කරන්න.

IV වර්ණ ධර්ම පිළිබඳ බමුණු මතවාද බුදුරජාණන් වහන්සේගේ විචාරයට ලක්වූ ආකාරය පැහැදිළි කරන්න.

## [[[ 2010/2011 ]]]

## 01 වන ප්‍රශ්නය

I සියල්ල මවන ලද්දේ මහා බ්‍රහ්මයා විසින් යැයි බ්‍රාහ්මණ ඉගැන්වීම් වල පැවසේ. මහා බ්‍රහ්මයාගේ එකී මැවීම් හතරක් නම් කරන්න.

II බ්‍රාහ්මණ සමාජය තුළ පැවති වර්ණ භේදය නිසා සමාජ යහපැවත්මට බාධා ඇතිවීම හේතු කොටගෙන ඇතම් ජන කොටස්වලට මූළික මිනිස් අයිතිවාසිකම් පවා අහිමි විය. එසේ අහිමි වූ මූළික මිනිස් අයිතිවාසිකම් හතරක් නම් කරන්න.

III කාන්තාව භාරත සමාජයේ පහළම තැනට ඇද දමා තිබූ ආකාරය කෙටියෙන් දක්වා ඇය සමාජයේ ඉහළම තැනට ඔසවා තැබීමට බුදුරජාණන් වහන්සේ ක්‍රියා කළ ආකාරය පැහැදිළි කරන්න.

IV " භාරතීය සමාජයේ පැවති විවිධ පීඩාවන්ගෙන් ජනයා මුදවා ගැනීමට දේශනාවන් පැවැත්වීම මෙන්ම ප්‍රායෝගික ක්‍රියාවන්ද උපයෝගී කරගත් ශ්‍රේෂ්ඨ සමාජ ශෝධකයකු ලෙස බුදුරජාණන් වහන්සේ සුවිශේෂ වෙති" මේ කියමන ඇගයීමට ලක් කරන්න.

## [[[ 2009/2010 ]]]

## 01 වන ප්‍රශ්නය

I වර්ණ භේද ප්‍රතිපත්තිය නිසා ශුද්‍ර යැයි හැඳින්වුණු ජන කොට්ඨාශයට අහිමි වූ මානව හිමිකම් හතරක් නම් කරන්න.

II මනුස්මෘතියට අනුව වෛශ්‍යාන්ට නියමවී තිබුණු යුතුකම් හතරක් නම් කරන්න.

III භාරතයේ සිටි පංචමයන් කවුරුන්දැයි හඳුන්වා ඔවුන්ට හිමිවී තිබුණු සමාජ තත්ත්වය පැහැදිළි කරන්න.

IV "බ්‍රාහ්මණ ප්‍රඥප්ති නිසා භාරතීය සමාජයේ ඇතැම් ජන කොටස් අතිශයින් පීඩාවට පත්වූහ". යන කියමන පරීක්ෂාවට ලක් කරන්න.

## [[[ 2008/2009 ]]]

## 01 වන ප්‍රශ්නය

I ත්‍රිවේදය නම් කරන්න.

II බ්‍රාහ්මණයන් තම සමාජ ස්තරයට ඉහළම වරප්‍රසාද ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ මත හතරක් දක්වන්න.

III බ්‍රාහ්මණයන්ගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව අස්සලායන බමුණා කළ ප්‍රකාශයේ ඇතුළත් කරුණු දක්වා ඒවායේ වැදගත්කම පිළිබඳ සමාලෝචනයක් කරන්න.

IV "බුදුරජාණන් වහන්සේගේ දේශනා හා උන්වහන්සේ ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති, සමාජ සංවිධානයෙහි ආධිපත්‍ය හිමිකරගෙන සිටි බ්‍රාහ්මණයින්ගේ මිත්‍යා මත බිඳ වැටීමත් සමාජ සාධාරණය ස්ථාපනයටත් පාදක විය". යන කියමන පරීක්ෂාවට ලක් කරන්න.

## [[[ 2007/2008 ]]]

## 01 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ ධර්මයට අනුව පුද්ගලයකුගේ ජීවිතය ආශ්‍රම ධර්ම හතරකට බෙදිණි.ඒ ආශ්‍රම ධර්ම නම් කරන්න.

II "පුද්ගලයෙකු බ්‍රහ්මචාරී අවධියේදී ඉදිරි සමාජ ජීවිතයට මුහුණදීමට අවශ්‍ය වන පෞරුෂය ගොඩනගා ගනියි". මේ කියමන පැහදිළි කරන්න.

III ආශ්‍රම ධර්මවලදී මිනිසා ආගමික ජීවිතයකට යොමු කරන අවශ්ථා දෙක නම් කර එම අවශ්ථාවලදී පුද්ගලයෙකුගේ ජීවිතය ගෙවී යන ආකාරය විස්තර කරන්න.

IV "සාම්ප්‍රදායික ආකෘතියකට පුද්ගලයා කොටු කරන අවස්ථා ලද ආශ්‍රම ධර්මයන්ගෙන් මිදී ඵලදායී අර්ථවත් ජීවිතයක් ගත කිරීමට බුදු සමය නිසා පුද්ගලයාට ඉඩ සැළසිණි". යන කියමන පරික්ෂාවට ලක් කරන්න.

## [[[ 2006/2007 ]]]

## 01 වන ප්‍රශ්නය

I චතුර් වර්ණය නම් කර, මනුස්මෘතියෙහි දැක්වෙන පරිදි එම කුල හතරට පැවරී තිබුණු සමාජ ආර්ථික කාර්යයන් වෙන වෙනම දක්වන්න.

II බ්‍රාහ්මණ කුලයේ ශ්‍රේෂ්ඨත්වය තහවුරු කිරීමට ඔවුන් ගත් උත්සාහය පැහැදිළි කරන්න.

III බ්‍රාහ්මණ චින්තන සම්ප්‍රදාය නිසා කාන්තාව පීඩාවට පත් වූ ආකාරය පැහැදිළි කරන්න.

## [[[ 2005 ]]]

## 01 වන ප්‍රශ්නය

I සමාජ සම්භවය මහා බ්‍රහ්මයාගෙන් සිදු වූ බව දැක්වෙන "බ්‍රාහ්මනස්‍ය මුඛමාසීත්" යන ශ්ලෝකය සම්පූර්ණ කර ලියා,බුද්ධකාලීන භාරතයේ පැවති සමාජ ස්ථර හතරක් නම් කර එක් එක් ස්තරය මහා බ්‍රහ්මයාගේ කුමන අවයව වලින් හටගත්තේදැ'යි නම් කරන්න.

II "බ්‍රහ්ම නිර්මාණවාදය මත ගොඩනැගුණු සමාජ පන්ති ක්‍රමය විවිධ සමාජ ස්තරවලට අයත් සාමාජිකයන්ගේ මානව අයිතීන් අහිමි කරන්නක් විය". යන ප්‍රකාශය බුද්ධකාලීන භාරතීය සමාජ තොරතුරු ගෙනහැර දක්වමින් පරික්ෂාවට ලක් කරන්න.

III "බ්‍රාහ්මණ සමජ ක්‍රමය මත අහිමිවී ගිය සාමාජික අයිතිවාසිකම් නැවත ලබා දීමට සිය දේශන යොදා ගනිමින් බුදුරජාණන් වහන්සේ මානව චින්තනය නව මගකට යොමුකළ සේක". මේ ප්‍රකාශනය උදාහරණ සහිතව පැහැදිළි කරන්න.

## [[[ 2004 ]]]

## 01 වන ප්‍රශ්නය

I ආශ්‍රම ධර්ම යනු මොනවාදැ'යි සැකෙවින් දක්වන්න.

II සංවිධානාත්මක පුද්ගල ජීවිතයක් ගොඩනගා ගැනීමට ආශ්‍රම ධර්ම යොදාගත හැකි ආකාරය විසතර කරන්න.

## [[[ 2003 ]]]

## 01 වන ප්‍රශ්නය

I වර්ණ භේදවාදී භාරතීය සමාජයේ අධ්‍යාපනය නමින් අදහස් වූයේ කුමක්දැ'යි සැකෙවින් දක්වන්න.

II එකී අධ්‍යාපන ප්‍රතිපත්තියේ යහපත් හා අයහපත් ලක්ෂණ විස්තර කරන්න.

## [[[ 2001 ]]]

## 01 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණික වර්ණ ශුද්ධිය සම්බන්ධයෙන් අස්සලායන බමුණා බුදුරදුන් හමුවේ පැවසූ කරුණු පහක් සඳහන් කරන්න.

II බ්‍රාහ්මණික වර්ණ ශුද්ධිය බුදුන් වහන්සේ විවරණය කළ අයුරු විස්තර කරන්න.

## [[[ 2000 ]]

## 03 වන ප්‍රශ්නය

I ප්‍රාග් බෞද්ධ භාරතීය වර්ණ ධර්මවල පදනම සැකෙවින් දක්වන්න.
II භාරතීය වර්ණ ධර්ම බෞද්ධ විචාරයට ලක්වූ ආකාරය පරීක්ෂා කරන්න.

## [[[ 1999 ]]]

## 01 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ පැවති රැකියා පහක් නම් කරන්න.
II කුලය හා රැකියාව අතර පැවති සම්බන්ධය පැහැදිළි කරන්න.

## [[[ 1998 ]]]

## 01 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ ධර්මය විසින් හඳුන්වා දෙන ලද චතුරාශ්‍රම ධර්ම නම් කරන්න.
II බ්‍රාහ්මණ ධර්මයට අනුව ඒ එක් එක් අවධියට පැවරී තිබූ කාර්‍ය විස්තර කරන්න.

## 02 වන ප්‍රශ්නය

I සමාජ ප්‍රභවය පිළිබඳ බ්‍රාහ්මණ මතය කෙටියෙන් සඳහන් කරන්න.
II භාරතීය සමාජ සංවිධානයේදී එම බ්‍රාහ්මණ මතය කෙතෙක් දුරට ගැළපේද? නොගැළපේද? යන්න අර්ථ දක්වන්න.

## [[[ 1997 ]]]

1. ක්‍රි.පූ හයවන සියවසේ භාරතීය සමාජ සංවිධානය පිළිබඳ විධිමත් විස්තරයක් කරන්න.

## [[[ 1996 ]]]

1. බ්‍රාහ්මණ වර්ණය ශ්‍රේෂ්ඨ ලෙස හුවා දැක්වීම සඳහා උපයෝගී කොටගත් සාධක කවරේදැ'යි දක්වන්න.